**<u>මෙම ලිපියේ අරමුන වගකීමකින් තොරව ශබ්ද විකාශන යන්ත්‍ර හිතුමතේ භාවිතා කිරීමේ වත්මන් ශ්‍රී ලාංකික සංස්කෘතිය මදක් යහපත් තත්වයකට පත්කිරීමට අදාල පාර්ශවයන්ගේ අවධානය යොමුකිරීමයි.</u>**

ගරු ස්වාමීන්වහන්ස, පූජකතුමනී, මහත්මයානෙනි, මහත්මියනි, පොලිස් නිලධාරී මහතුනි, පාරිසරික සංවිධානවල මහතුනි,

<u>ශබ්ද විකාශන යන්ත්‍ර මගින් සිදුවන හිරිහැර</u>

මගේ අත්දැකීම් වලට අනුව ලංකාව තුල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරිමේදී නිතරම පහත සඳහන් වැරදි සිදුවේ.

- පොලීසියෙන් අවසර නොගැනීම හෝ පොලීසියෙන් අවසර දුන් කාලසීමාවට පටහැනිව භාවිතය.
- නිසි අවසරදීමේ පිලිවෙතක් හෝ පාලන ක්‍රමයක් පොලීසිය සතුව නොමැතිකම.
- ශබ්ද විකාශන යන්ත්‍ර අදාල භූමිය තුල පමනක් නොව ඊට පිටතින්ද සවිකිරීම සහ එය සාමාන්‍ය භාවිතය ලෙස පිලිගැනීම.
- අවශ්‍ය පමනට වඩා ඉතා වැඩි ශබ්දය.
- "ආගමික කටයුතු" යන වර්ගීකරනය යටතේ ඉහත සඳහන් සියලු වැරදි කරන අතර, එම වැරදි පෙන්වා දීමට ඉදිරිපත් වන්නන් "ආගම් විරෝධීන්" ලෙස නම් කිරීම.

පහත ලිපියේ ඉහත කරුනු වැඩිදුර විස්තරකෙරේ.

මෙම ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරන්නේ පන්සලක්ද, පල්ලියක්ද, පාසැලක්ද, වෙලඳ ආයතනයක්ද, නිවෙසක්ද යන්න හෝ ප්‍රචාරය කරන්නේ පිරිත්ද, යාඥාද, වෙලඳ ප්‍රචාරයක්ද, සංගීතයද යන්න වැදගත් නොවේ. වැදගත් වන්නේ එය ඇතමෙකුට හිරිහැරයක් වන්නේද නැද්ද යන්නයි. දවසේ ඕනෑම වෙලාවක කෙරෙන ශබ්ද දූෂනයන් පිලිඹඳව ඉහත ප්‍රකාශය වලංගුවේ.

පන්සල් හා පල්ලි වැනි පූජනීය ස්ථාන මගින් කෙරෙන මෙවන් ශබ්ද දූෂන සම්බන්ධයෙන් නිතරම ඉදිරිපත් කෙරෙන නිදහසට කරුනක් නම්, එය සිදුකෙරෙනුයේ අවට ප්‍රදේශවාසීන් "බහුතරයගේ" කැමැත්ත ඇතිව බවයි. බොහෝවිට සත්‍යය නම් මෙයට අකමැති බහුතරය හොඳ හිත පලුඳු කරගැනීමට හා ආගමික කටයුතු වලට විරුද්ධවන්නන් ලෙස හංවඩු ගැසීමට ඇති අකමැත්ත නිසා මෙම හිරිහැරය ඉවසන බවයි. ඇත්තවශයෙන්ම කියතොත් මෙවැනි අවස්ථාවක බහුතරය කුමක්ද සුලුතරය කුමක්ද යන්න වැදගත් නොවේ. සුලුතරයකගේ හෝ මූලික අයිතීන් උල්ලංඝනයවේ නම්, එවන් ක්‍රියාවල නිරත වීමට බහුතරයට සදාචාරාත්මක අයිතියක් නැත. සදාචාරාත්මක අයිතිය පසෙක තබමු, ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතාකිරීම පිලිඹඳව ලංකාවේ වලංගු (නමුත් බොහෝවිට හරියාකාරව ක්‍රියාත්මක නොවන) නීතියක් ඇත. පොලීසියේ විශෙෂ අවසරයක් නොමැතිව මෙවැනි ආකාරයට රාත්‍රී කාලයේ හෝ පාන්දර ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීම නීති විරෝධී වේ. පොලීසිය ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර ලබාදෙන ක්‍රියාපටිපාටියද ප්‍රශ්නකාරීය. පොලිස් ස්ථානවලින් විමසූවිට ඔවුන් පවසන්නේ "ආගමික කටයුතු සඳහා" ඕනෑම ආකාරයකට ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතාකිරීම් අවසරදෙන ලෙස "ඉහලින්" ඔවුන්ට දන්වා ඇති බවයි. නියෝග නිකුත් කරන ඉහලතැන් ප්‍රශ්නය පිලිබඳව සීතාබලා දැනුවත්ව තීරන ගන්නේදැයි සැකයක් මතුවේ.

නිවෙස්වල සිදුකරන පිරිතක් වැනි ආගමික කටයුත්තක් සඳහා පවා පොලීසියෙන් අවසර ගෙන පැය 24ක් පුරා "ගමටම" ඇසෙනසේ ප්‍රචාරය කිරිමේ සිරිතක් ඇතැම් පලාත්වල තිබේ. මෙවන් කටයුත්තකට පොලීසිය අවසර දීමේ පිලිවෙත කුමක්ද? මෙම ශබ්දය ඇසෙන මානයේ සිටින සියලුම දෙනාගේ කැමැත්ත පොලීසිය හෝ අවසර ඉල්ලා සිටින පාර්ශවයන් ලබා ගන්නේද? කෙසේවත් එසේ සිදු නොවේ. මෙම ශබ්දය පවතින්නේ එක් රාත්‍රියක් තුල පමනක් බව සැබෑය. එහෙත් අසල නිවසක රෝගියෙක්, පසුදින උදෑසන විභාගයකට හෝ සම්මුක පරීක්ෂනයකට පෙනීසිටින්නෙක් වැනි එදින රාත්‍රියේ නින්ද අත්‍යවශ්‍ය අයෙක් සිටිය හැක.

ශබ්දය ගමන් කරන ආකාරය පාලනය කිරීමට අපහසුය. එබැවින් එය කැමති අකමැති සියලු දෙනාගේ කන් තුලට ඇතුලුවේ. උදාහරනයක් ලෙස කන්දක් මුදුනේ පිහිටි පන්සලක හෝ පල්ලියක සිට කෙරෙන විකාශනයක් එම කන්ද පාමුල සිටින "කැමැත්ත දැක්වූ" අතලොස්සට වඩා හොඳින් ඇසෙන්නේ කන්දට ඈතින් පදිංචි ප්‍රදේශවාසීන්ටය.

තත්වය තවදුරටත් විග්‍රහ කරතොත් හෙලිවන කටුක සත්‍යයක් නම්, මෙම "ආගමික ශබ්ද දූෂනය" පන්සල් හා මුස්ලිම් පල්ලි අතර සිය "බල ප්‍රදේශ" තහවුරු කරගැනීමේ සටනක ආයුධය බවට පත්ව ඇති බවයි. උදාහරනයක් ලෙස සැලකිය යුතු මුස්ලිම් ජනගහනයක් වාසය කරන මහනුවර හා අවට ප්‍රදේශවල තදින්ම මෙය සිදුවේ. මුස්ලිම් ආගම පමනක් ඇදහිය හැකි මැද පෙරදිග රටවල ඇති පල්ලි ආදර්ශයට ගනිමින් ලංකාව වැනි බහු ආගමික රටක කන් අඩි පුපුරන තරම් ශබ්දයෙන් මුලු නගරයටම ඇසෙන පරිදි යාඥා විකාශනය කල හැකි නොවේ. ශ්‍රද්ධාවත් පිරිසට සිය ආගමික වතාවත් කනට මිහිරි වුවද සෙස්සන්ට එය කර්න කඨෝර වදයකි. අවාසනාවකට

මෙන් මුස්ලිම් පල්ලි වලින් මෙම නරක ආදර්ශය ලබාගත් පන්සල්ද කන් අඩි පැලෙන ලෙස පිරිත් රටට බෙදති. ගුවන් විදුලි යන්ත්‍ර හා කැසට් යන්ත්‍ර නොමැති නිවසක් නොමැති මේ රටේ, මේ අන්දමට ශබ්ද විකාශන යන්ත්‍ර මගින් පිරිත් ප්‍රචාරය කල යුත්තේ මන්ද යනු මට නම් නොතේරේ!

වත්මන් සමාජයේ නොයෙකුත් පුද්ගලයෝ තම රැකියාව හා ජීවන පුරුදු අනුව නොයෙකුත් ජීවන රටා අනුගමනය කරති. මේ හැමදෙනගේ මූලික අයිතීන් සුරැකිය යුතුවේ. උදාහරනයක් ලෙස ඇතමෙකු පාන්දර 1.00 පමන නින්දට ගොස් තරමක් පමාවී අවදිවෙති. එවැනි පුද්ගලයෙකුට පාන්දර 5.00 යනු හොඳින් නිදාගතයුතු වේලාවකි. තවද බොහෝදෙනා සති අන්තයේ දිනවල පාන්දරම අවදිනොවේ. සෑම දිනකම පාන්දර 5.00ට පමන ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් නොයෙකුත් වැඩසටහන් ප්‍රචාරය කිරීම එම පුද්ගලයන්ගේ නින්දට බධාවකි. එම පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුවය හීනවීමට මෙය බලපානු ඇත. තවද නොයෙකුත් රෝගී තත්වයන් ගෙන් පෙලෙන හෝ පාඩම් වැඩවල නිරත වන අයට දවසේ කොයි වේලාවක වුවද අනවශ්‍ය ශබ්ද ඇසීම මහත් හිරිහැරයකි.

පුවත්පතක පලවූ වාර්තාවකට අනුව මාවනැල්ල ප්‍රදේශයේ එක්තරා මුස්ලිම් පල්ලියක මහ හඬකින් කෙරෙන යාඥා මෙහෙයට පිලිතුරු ලෙස එම ශබ්දය අඩු කිරීමට පොලීසිය සමගින් (හෝ පොලීසිය නොමැතිව) එම පල්ලියක සමහ කථාබහක් කරනු වෙනුවට, අසල පන්සලක් අවට වෙසෙන බෞද්ධ පිරිසක් කර ඇත්තේ තමන්ද මහ හඬකින් ආගමික වැඩසටහන් ප්‍රචාරය කිරීමයි. "මුහුන සමග තරහවී නහය කපාගැනීම" යනු මේ අවස්ථාව විස්තර කිරීමට සුදුසු යෙදුමකි.

මේ ලිපිය ලියන මා වාසය කරන ප්‍රදේශයේ සැලකිය යුතු කතෝලික ජනගහනයක් වාසය නොකරන නිසා සහ කතෝලික පල්ලි බහුලව නොමැති නිසා ඔවුන්ද මේ ආකාරයට ශබ්ද දූෂනයේ යෙදෙන්නේද නැද්ද යන්න මම නොදනිමි. කතෝලික බහුතරයක් වෙසෙන පෙදෙසක මෙවන් ක්‍රියා නොකරෙන්නෙ යයි සිතිය නොහැකිය. හින්දු කෝවිල් සම්බන්දව තත්වයද මම නොදනිමි. බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් යන එක් ආගමක්වත් 20වන සියවසේ බිහිවුනු ආගම් නොවේ. මෙම ආගම් එකකටවත් සිය වතාවත් කිරීම සඳහා 20වන සියවසේ තාක්ෂනය හා "ලවුඩ් ස්පීකර්" අත්‍යවශ්‍ය යැයි සිතිය නොහැකිය. ඉස්ලාම් ආගම අදහන බැතිමතුන්ගේ ශ්‍රද්ධාවට මා ගරු කරන නමුත් ඔවුන්ගේ ඇතැම් මතිමතාන්තර සමග මට කිසිසේත්ම එකග විය නොහැක. උදෑසන 4.30 වැනි හෝරාවක මහත් හඬකින් යාඥා විකාශනය කිරීමට ඔවුන්ට ශුද්ධවූ අයිතියක් ඇතැයි මම පිලිනොගනිමි. මෑතකදී "ඉස්ලාම්කරනය" වීමට පෙර බෞද්ධ සිද්ධස්තාන උදේ සවස "යාඥා" මෙහෙයයන් පැවැත්වූයේද නැත. තුන්වැනි ලෝකයේ රටක මෙවන් මතිමතාන්තර පලදැරිය හැකි නමුත්, පුද්ගල නිදහස ගරුකරන දියුනු රටක අසල්වැසියාට හිරිහැරයක් වන පරිදි ගෙදරක හයියෙන් කතා කිරීම පවා නීතිය ඉදිරියේ වරදකි.

සෑම හන්දියක් ගානේම යකඩ කටවල් සවිකොට උදේ හවස පිරිත්, යාඥා හෝ විරිඳු බන "දැම්මේ" ඇති ආගමික වටිනාකමද මට නොතේරේ! අතීතයේදි නම් පිරිත් යනු "දමන" දෙයක් නොව "සජ්ජායනය" කරන දෙයකි. තරමක පිරිසක් එකතුවී, සැදැහැ සිතින් යුතුව කෙරෙන සූදානමකින් අනතුරුව එක් රාත්‍රියක ඒ වෙනුයෙන්ම කැපවී මහත් හරසරින් කෙරෙන සජ්ජායනයක මිහිරි බව හා එය ඇසීමෙන් ලැබෙන මානසික සුවය මෙවැනි යකඩ කටකින් හා කැසට් කැබැල්ලකින් ලැබේද? පිරිත් යනු කැසට් යන්ත්‍රයට කැසට් කැබැල්ල ඔබා බොත්තමක් තදකිරීමෙන් අනතුරුව ඇතිවන තුට්ටු දෙකේ "ශබ්දයක්" පමනක් බවට පත්වෙමින් පවතී.

ආගමික ආයතන මගන් වැඩිදුර නොසිතා, රැල්ලට අනුව යමින් මෙවන් බොහෝ නොමනා හිරිහැරකාරී ශබ්ද විකාශන සිදුකරයි. පින්කම්, සල්පිල්, උත්සව, වෙසක් තොරන වැනි අවස්ථා වලදී අදාල භූමි ප්‍රදේශයට පමනක් ඇසෙන පරිදි නොව, අහල ගම් හතකට ඇසෙනසේ ශබ්ද විකාශනය සිදුවේ. ඇතැම් විට උත්සව භූමියෙන් පිට පාරවල් වලද ශබ්ද විකාශන යන්ත්‍ර සවිකෙරේ. විශෙශයෙන්ම වෙසක් තොරන වැනි එක් දිනකින් අවසන් නොවන එමෙන්ම පාන්දර හෝරාවන් තෙක් දිවෙන කටයුත්තකදී අනවඅනවශ්‍ය ලෙස මහත් විශාල ශබ්දයකින් තොරනේ කතාව සිදුකරද්දී අවට නිවැසියන් දින ගනනාවක් උපේක්ෂාවෙන් යුතුව එයට සවන් දියයුතුවේ. මෙවන් ඉතා ප්‍රාථමික මට්ටමේ වැරදි ක්‍රියානම් වහා නතර කල යුතුවේ. අන් අයට හිරිහැර නොවන තාක් කල් ඕනෑම ආගමක් ඇදහීමේ හෝ කිසිම ආගමක් නොඇදහීමේ නිදහස මේ රටේ ඇත. ඒ ඒ ආගමික බැතිමතුන් සිය වතාවත් සෙස්සන්ට වදයක් නොවන පරිදි කරගන්නේ නම් මැනවි.

තවත් ඉතා අවාසනාවන්ත තත්වයක් නම් ඇතැම් පාසැල්ද සිය වැඩකටයුතු සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගැනීමයි. උදෑසන රැස්වීම සහ වෙනත් වැදගත් නිවේදන සඳහා කිසියම් ඇමතීමේ ක්‍රමයක් යොදාගැනීම වරදක් නොවේ. එනමුත් එය කල යුත්තේ කුඩා ස්පීකර් විශාල ප්‍රමානයක් (paging system) අවශ්‍ය ස්ථානවල සවිකිරීමෙන් මිස විශාල ශබ්ද විකාශන යන්ත්‍ර කිහිපයක් පාසැලේ තැන් කිහිපයක සවිකිරීමෙන් නොවේ. ලංකාවේ බොහෝ පාසැල්වලට හරියාකාර paging system සවිකිරීමට මුදල් ප්‍රතිපාදන නොමැත. එවන් අවස්තාවලදී කලයුත්තේ මුදල් ප්‍රතිපාදන ලැබෙන තෙක් පැරනි ක්‍රමයට උදෑසන රැස්වීම පවත්වනු මිස ඩෙසිබල් 100ක පමන ශබ්දයකට නිරන්තරව කුඩා ලමුන් ලක් කිරීම නොවේ. මා දන්නා එක් පාසැලක් සිය විකාශන යන්ත්‍ර මගින් උදෑසන 7.00 සිට 8.00 දක්වා කාලය තුල අවට නිවෙස් වලටද කරදරයක් වනසේ සංගීතයද ප්‍රචාරය කරයි. අසල්වැසියන්ට කරදරයක් නොවනසේ ගෙදරක

රේඩියෝව පවා පරිස්සමින් පාවිච්චිකලයුතු බව කියාදිය යුතු පාසැල ලමුන්ට දෙන ආදර්ශය කුමක්ද?.

මෙම ලිපියේ මා කතා කරන්නේ එක් ප්‍රශ්නයක් ගැන පමනි. අද ලංකාවෙ පවතින වඩාත්ම දැවෙන ප්‍රශ්නය මෙය නොවේ. එමෙන්ම මෙවන් ශබ්ද දූෂන සිදුකරන්නේ ආගමික ආයතන හා පාසැල් මගින් පමනක් නොවේ. එනමුත් අපි ප්‍රශ්න විසඳීම කොතනකින් හෝ පටන් ගත යුතුය. කැසට් අලෙවිසැල්, ලොතරුයි අලෙවිසැල්, උත්සව ශාලා, රස්තියාදුකාර මාධ්‍ය ආයතන මගින් කෙරෙන ජංගම බජව්, රථවාහන අනවශ්‍ය ලෙස නලා හැඬවීම, දේශපාලුවන්ගේ නෝයෙකුත් හොරනෑවන් ආදිය නගර ආශ්‍රිත ශබ්ද දූෂනයේ මූලික හේතූන්වේ. එනමුත් මේවා නැවැත්වීමට කලින් නගරයෙන් බැහැරව නිහඬ පරිසරයක නිවෙස් තනාගත් පිරිස් වලටද නිදහසේ ජීවත් වීමට නොහැකි වන ලෙස කෙරෙන හිරිහැර මුලින්ම නැවැත්විය යුතුබව මගේ හැගීමයි.

ඉහත සඳහන් දේ එක් පුද්ගලයෙකුගේ හෝ පුද්ගලයින් කිහිප දෙනෙකුගේ වැරදි නිසා සිදුවන්නේ නොවේ. වරද ඇත්තේ ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන "ක්‍රමය" තුලය. වෙනස් විය යුත්තේ අප දැනට සාමාන්‍ය තත්වය ලෙස සලකන ලංකාවේ මෙම "ක්‍රමයයි". දැනට අනුගමනය කරන ක්‍රමය අනුව ශබ්දය නොමැතිව මෙරට කිසිම කටයුත්තක් සිදුනොකරයි. නිහඬ නිසංසල පරිසරයක සිදුකලයුතු පන්සලේ පහන් පිංකම වැනි කටයුතු සංවිධානයේදීද මුලින්ම කෙරෙනුයේ ස්පීකර් ගස් බැඳීමයි. කනපැලෙන ලෙස සිංදු නොදමා රියැදුරන්ට බස්රථ ධාවනය කල නොහැක. මඟුල් ගෙදරට එන අමුත්තන්ට සතුටුසාමීචි කථා සිදුකල නොහැකි ලෙස මහත් ශබ්දයෙන් ඩී.ජේ. මියුසික් දමයි. මඟුල් ගෙදරට එන අමුත්තන්ගේ පමනක් නොව අහල පහල අයගේ කන් වලද කරගැට එයි.

අප කැමති වුවත් අකමැති වුවත් ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ව්‍යූහය සැකසෙන්නේ දියුණු යැයි සම්මත ඇමරිකාව, ජපානය, සිංගප්පූරුව වැනි රටවල් ආදර්ශයට ගනිමිනි. මෙවන් රටවල පුද්ගල නිදහසට බාධා කෙරෙන අනවශ්‍ය ශබ්ද දැඩි නීති මගින් පාලනය වේ. උදාහරනයක් ලෙස, රතිඤ්ඤා භාවිතය මෙම රටවල සපුරා තහනම්ය. ශ්‍රී ලංකාවේ අද පවතින පුද්ගල නිදහස ගරු නොකරන අහිතකර තත්වයන් අනාගතයේ වෙනස් විය යුතු අතර, කුඩා පියවර තබමින් දියුණු යැයි සම්මත රටවල ඇති පුද්ගල නිදහස අපද ලගා කරගත යුතුය. ඉහත සඳහන් රටවල ඇරඹි, පසුව ඒ රටවලින් බැහැර කරන ලද අහිතකර දේවල් අප තවමත් භාවිතා කිරීම අවාසනාවකි. තාක්ෂනය මෙවන් නිරර්ථක දේ වලට නොව පලදායි කටයුතු වලට යොදා ගනිමු. ලයිට් කනුවක් ගානේ සවිකෙරෙන යකඩ කටවලින් ලොවට මුරගා කියවෙන්නේ අන් කිසිවක් නොව අපගේ සිවිල් සමාජයේ ප්‍රාථමික ස්භාවයයි. අනවශ්‍ය ශබ්ද යනු කාර්මීකරනයේ හා නාගරීකරනයේ නොවැලැක්විය හැකි අතුරුපලයක් නොවේ. අන් අයගේ පුද්ගල නිදහස ගරුකරන විනයගරුක පැවැත්ම, හා එය ප්‍රමානවත් නොවන අවස්ථාවලදී නීතිය මගින් අනවශ්‍ය ශබ්ද පරිසරයෙන් ඉවත් කල හැක.

එක් රැයකින් මෙය සිදුනොවේ. ආරම්භයක් ලෙස පොලීසිය ක්‍රියාත්මකවී අනවසර ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය හා වෙනත් ශබ්ද දූෂන පිලිබඳ ලැබෙන පැමිනිලි දැනට වඩා උනන්දුවකින් මෙහෙයවන්නේ නම් මැනවි. පොලිස් නිලධාරි මහතුන් සහ අනෙකුත් ජනතාව අතර ආකල්පමය වෙනසක්ද ඇතිවිය යුතුවේ. ආගමකට මඳකින් හෝ සම්බන්ධ කටයුත්තකට යමෙක් විරෝධයක් දැක්වුවහොත් පලමු උපකල්පනය නම් ඔහු හෝ ඇය අන්‍යාගමික වියහැකි බවයි. කිසියම් පුද්ගලයෙකුගේ ප්‍රධානත්වයෙන් කෙරෙන මෙවන් ක්‍රියාවකට විරෝධයක් දැක්වුවහොත් පලමු උපකල්පනය නම් එය පුද්ගලික අමනාපයක් නිසා බවයි. මෙම සියලු අඩුලුහුඬුකම් තනි පුද්ගලයින්ගේ වැරදි නොව පවතින ක්‍රමයේ අඩුපාඩුවේ.

නීති සකස්කරන ආයතන ප්‍රධානීන් හා පොලීසියට චක්‍රලේඛ නිකුත්කරන මූලස්ථානයේ නිලධාරි මහතුන්ගෙන් අප ඉල්ලා සිටින්නේ මෙම ලිපිය කියවා තේරුම් ගෙන, අදාල පියවර ගන්නා ලෙසයි. ශබ්ද විකාශන යන්ත්‍ර බලපත්‍ර නිකුත් කිරීමේදී ඒවා නිසි ආකාරයට මහජනයාට හිරිහැර නොවන ලෙසට පාවිච්චි කරන ආකාරය දැනුවත්කොට, ඉන්පසු ඒවා ඒ අන්දමට නිවැරදිව පිලිපදින්නේද යන්න සොයා බැලීම පොලීසියේ වගකීම විය යුතුය. ශබ්ද විකාශන යන්ත්‍ර නිකුත් කිරීමේ පලමු කොන්දේසිය විය යුත්තේ, ඒවා සවිකරන්නේ අදාල භූමිය තුල පමනක් බවයි. දේශපාලන රැස්වීම් වලින් පටන්ගත් පාරවල් දිගේ යකඩ කටවල් සවි කිරීමේ කැත පුරුද්ද වහාම නැවතිය යුතුය. දෙවන කොන්දේසිය නම් අඩුගනනේ රාත්‍රී 10 පසුව හා උදෑසන එලිය වැටෙන තෙක් වත් අවට නිවැසියන්ගේ නින්දට බාධා නොවන මට්ටමකට ශබ්දය පාලනය කලයුතු බවයි. විශේෂයෙන්ම එක් දිනකින් අවසන් නොවන කටයුතු සම්බන්ධයෙන් මෙම නීතිය තදින්ම ක්‍රියාත්මක විය යුතුය.

පාරිසරික සංවිධානවලින් අප ඉල්ලා සිටින්නේ මෙම ප්‍රශ්නය පිලිබඳව අදාල පාර්ශවයන් දැනුවත් කරන ලෙසයි.

මෙම ලිපිය අවසන් කිරීමට පෙර තව එක කරුනක් මතක් කිරීමට කැමැත්තෙමි. එනම් අමතකවූ රේඩියෝව හෙවත් ගුවන් විදුලි යන්ත්‍රය පිලිබඳවයි. ඔබේ නිවස තුලට යන්න. ඔබට රේඩියෝවක් හමුවනු ඇත. ඔබට රේඩියෝවක් හමුනොවුනේ නම් පුදුමයකි. මක්නිසාදයත් ලංකාවේ නිවෙස් සියයට 99.9ක මෙම උපකරනය තිබේ. රේඩියෝව යනු ලවුඩ් ස්පීකරයට වඩා අලුත් තාතාක්ෂන ක්‍රමයකි.

මහනුවර මුස්ලිම් මහපල්ලියේ හා පිලපිටිය කුඩා පන්සලේ සිට, ලංකාවේ සෑම අස්සක මුල්ලක පිහිටි පල්ලි, පන්සල්, කෝවිල්, ලවුඩ් ස්පීකර් අටවාගෙන කරන්නට උත්සාහ කරන්නේ කුමක්ද? ඔවුන්ගේ මූලික අවශ්‍යතාවය නම් සිය ආගම අදහන නිවෙස්වලට ආගමික වැඩසටහන් නියමිත වෙලාවට ඇසෙන්නට සැලැස්වීමයි. (එසේ නොමැතිව, අන්‍යාගමිකයගේ කන් රිදවීම හෝ ඒ පලාතේ ජිවත් වීම ඔවුන්ට එපා කරවීම නොවේ යයි සිතමි. අවශ්‍යතාවය එය නම් ලවුඩ් ස්පීකරය යනු එයට ගැලපෙන අවියකි.)

උදෑසන ඔබේ රේඩියෝවේ මීටරය කරකවන්න. ඔබට අවශ්‍ය පිරිත් නම් පිරිත්ද, බන නම් බනද, යාඥා නම් යාඥාද, සංගීතය නම් සංගීතයද ඇසිය හැකිබව ඔබට පෙනෙනු ඇත. තවද ඔබ නිවසේ සංගීතය අසන විට ඔබගේ අසල්වැසියන්ට සිය ආගමික වැඩසටහන් ඇසිය හැකි බවද වැටහෙනු ඇත. බහු ආගමික ආයතන හා බහු ආගමික අසල්වැසියන්ට එකිනෙකා හා හෙද නොවී සමගියෙන් සිටිය හැකිබව අවබෝධ වනු ඇත. ඒ ඒ ආගම් වලට වෙනම "ලවුඩ් ස්පීකර්" රාජ්‍යයන් අවශ්‍ය නොවන බව හා ඒකීය ශ්‍රී ලංකාවක් තුල සියලු දෙනාට තමතමන්ගේ රේඩියෝ හෝ ටී.වී චැනලයන් භාවිතා කල හැකි බව සක් සුදක්සේ පැහැදිලි වනු ඇත.

ස්වාමීන් වහන්ස, පූජකතුමනි, ඔබගේ වහලය මත ඇති බෙදුම්වාදී ලවුඩ් ස්පීකරය අදම ගලවන්න. හොඳ අසල්වැසියන් ලෙස එකිනෙකාගේ වෙනස් අවශ්‍යතාවලට ගරුකරමින් ජිවත් වන ආකාරය ඔබගේ බැතිමතුන්ට කියාදෙන්න.

ස්තුතියි,

- වගකීමක් හෝ අන් අය ගැන තැකීමක් නොමැතිව ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරන්නන් ගෙන් නිතරම පීඩා විඳින පුරවැසියෙක් විසින් රචිතය.

ඉහත ලිපිය තරමක් ආවේගශීලීවේ. දැන් අපි ආවේගශීලී නොවී සත්‍ය උදාහරනය අවස්ථා කිහිපයක් ගෙන, එම උදාහරනවල සඳහන් තත්වයන් දැනට පවතින රාමුව තුල සිටිමින්ම යහපත් කරගන්නේ කෙසේද යනුවෙන් කල්පනා කරමු.

<u>උදාහරනය 1 - හෝමාගම නගරයේ වෙසක් තොරන</u>

හෝමාගම නගරයේ වෙලඳ සංගමය විසින් වාර්ශිකව වෙසක් තොරනක් ඉදි කරයි. නගර මධ්‍යයේ ඉඳිවන මෙම තොරන වෙසක් දින රාත්‍රියේ සිට සතියක් පුරා සෑම දිනකම අඳුර වැටුන හෝරාවේ පටන් පාන්දර එලිය වැටෙන තෙක් ක්‍රියාත්මකවේ. "තොරනේ කථාව" පැවසීමට නගරය පුරා ශබ්ද විකාශන යන්ත්‍ර සවිකෙරේ. මෙම ශබ්ද විකාශන යන්ත්‍ර මහත් හඬැතිව ඉහත සඳහන් කාල හෝරාවන් තුල ක්‍රියාත්මකවේ. තොරනේ සිට කිලෝමීටරයක පමන වට ප්‍රමානයක පදිංචි සිය ගනනක්වූ පවුල් රාත්‍රි හතක් පුරා එක එල්ලේ පීඩාවට පත්වෙති. හොඳ හිත පලුඳු කරගැනීමට හා ආගමික කටයුතු වලට විරුද්ධවන්නන් ලෙස හංවඩු ගැසීමට ඇති අකමැත්ත නිසා මෙම හිරිහැරය බොහෝ දෙනා මුවින් නොබැන ඉවසති. ඇතමුන් තාවකාලිකව නිවෙස් හැරයති. තොරනේ සංවිධායක මන්ඩලය බොහෝවට අවංකවම මෙම තොරන අවට නිවැසියන්ට මෙතරම් හිරිහැරයක් බව නොදනිති.

දියුනු යැයි සම්මත රටක නම් නිවාස සහිත පෙදෙසක මෙවැනි කටයුතු කිරීමට අවසර පොලීසියෙන් නොලැබේ. එම තත්වය එක් වරම මෙරට ඇතිවේ යයි සිතිය නොහැක. එබැවින් දැනට පවතින රාමුව තුලම අපට කල හැකි මොනවාදැයි බලමු. පලමු වරද නම් තොරන ඉදිරිපිටට රුස්වන පිරිසට පමනක් අවශ්‍ය වන ශබ්ද විකාශන යන්ත්‍ර නගරය පුරාම සවිකිරීමයි. මෙය අද පවතින "සිරිත" එය බැවින් කරන්නක් මිස අවශ්‍යතාවයකට කරන්නක් නොවේ. තොරන බැලීමට අවශ්‍ය පිරිස් තොරන ඉදිරිපිටට පැමිනෙති. එම පිරිසට ඇසෙන ලෙස පමනක් ශබ්දය භාවිතා කරන්නේ නම් ප්‍රශ්නයෙන් භාගයක් පමන ඉබේම විසඳේ. තවද වෙනත් බාහිර ශබ්ද නොමැති රාත්‍රි 10 පසු හෝරාවන් වල තොරන ඉදිරිපිටට පමනක් ඉතා අඩු ශබ්දයකින් ඇසෙන සේ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කර තොරනේ අවශ්‍යතාවය ඉටු කරන ගමන්ම අවට නිවැසියන්ට නින්දට මද විරාමයක් ලබාදිය හැක. මේවා කිරීමට නීති අවශ්‍ය නොවේ. තොරනේ සංවිධායක මන්ඩලය මානුෂිකව කල්පනා කර කටයුතු කිරීම ප්‍රමානවත්වේ.

<u>උදාහරනය 2 - පේරාදෙනිය, පිලපිටිය පන්සලේ උදෑසන පිරිත.</u>
<u>(පසු සටහන - මෙම</u> ශබ්දය 2003 නොවැම්බර් මස සිට නැවතී ඇත.)

පිලපිටිය ග්‍රාමයේ කන්දක් මුදුනේ පිහිටි කුඩා පන්සලක සෑම උදෑසනකම පාන්දර 5 සිට 6 දක්වා පුරා පැයක් ශබ්ද විකාශන යන්ත්‍ර මගින් පිරිත් ප්‍රචාරය කෙරේ. මෙය සැතපුම් 2ක පමන වට ප්‍රමානයකට (ගම් කිහිපයකට) හොඳින් ඇසේ. මෙය එම පන්සලේ දායක සභාව හා ස්වාමීන්වසන්සේලා එකතුව සැදැහැ සිතින් සහ යහපත් චේතනාවෙන් කරන්නක් බවට සැකයක් නැත. එනමුත් මෙම ක්‍රියාවලිය පහත ප්‍රශ්න මතුකරයි.

- අවට ප්‍රදේශවාසීන් දහස් ගනනනක් උදෑසන 5.00ට අවදි වීම (සති අන්තය ඇතුලුව) සහ

පුරා පැයක් මහත් ශබ්ද කාරිවූ පිරිතකට සවන්දීම අනිවාර්ය කිරීමට පන්සලේ දායක සභාව සහ පන්සල ඇසුරුකරන පිරිස තිරනය කිරීම කෙතරම් සදාචාර සම්පන්නද, කෙතරම් ප්‍රජාතන්ත්‍රවාදීද? උදාහරනයක් ලෙස කොලඹ රැකියාව කරන, සති අන්තයට පමනක් නිවෙසට පැමිනෙන පිරිස සිකුරාදා රාත්‍රියේ ගමනින් හෙම්බත්ව පාන්දර 1.00 හෝ ඊටත් පසුව නින්නදට යති. ඔවුන් පසුදින පාන්දර 5.00ට අවදි කිරීම කෙතරම් සාධාරනද?

- "පුද්ගල නිදහස" යන සංකල්පය ගරු නොකිරීම. කිසියම් පුද්ගලයෙකුට තමන් කැමති වෙලාවක නිනදට යාමට සහ අවදිවීමට ඇති අයිතිය පිලිනොගැනීම. "පමාවී අවදිවන්නන් කම්මැලියන්ය" ආදී පටු මත වැපිරීම.

- "බහුතරය" මෙම ක්‍රියාව අනුමත කරන බැවින් කාට හිරිහැරවුවත් අපි මෙය කලයුතුය, ආදීවශයෙන්වූ අධිපතිවාදී මත දැරීම. මෙවන් අධිපතිවාදී මත ආගම් අතර භේද අවුලුවනසුලු බැවින් ඉතා හානිකරය. අනෙක්අතට, බොහෝ විට "බහුතරය" පන්සලට ඇති ගරුත්වය, කෙනෙහිලිකම් වලට ලක්වීමට ඇති අකමැත්ත, වාද විවාද වලට පැටලීමට ඇති අකමැත්ත, ආදී කරුනු නිසා නිහඬව සිටිති.

- අසුවල් පන්සල හෝ පල්ලිය මෙම මෙම ක්‍රියාවම කරන බැවින් අපද කිරීමේ වරද කුමක්ද වැනි තර්කානුකූල නොවන අදහස් දැරීම.

මෙම තත්වය පවතින රාමුව තුලම සිටිමින් යහපත් කරගන්නේ කෙසේද යන්න සිතාබලමු.

ආරම්භයක් ලෙස මානුෂික හේතුන් සලකාබලා පහත පියවර වලින් අඩුගනනේ කිහිපයක්වත්, අඩුමගනනේ සති අන්තය තුලවත් (සෙනසුරාදා සහ ඉරිදා පාන්දර) ගන්නේ නම් මැනවි.

- ශබ්දය සීමා කිරීම.
- කාලය සීමා කිරීම (පැයක් නොව, ඊට වඩා අඩුවෙන්)
- පාන්දර 5.00ට නොව උදෑසන 8.00 වැනි වේලාවක් තෝරා ගැනීම.